**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**10 ශ්‍රේණිය          භූගෝල විද්‍යාව          ඔක්තොම්බර් 3 සතිය**

**නිපුණතාව ඃ-** භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම ඃ-** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය, ලක්ෂණ හා ගැටලු පැහැදිලි කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යාප්තියට බලපෑ සාධක ඉදිරිපත් කරයි.
* ව්‍යාප්තිය දැක්විය හැකි කර්මාන්ත ස්ථානගත වීම ශ්‍රී ලංකා ආකෘති සිතියමක ළකුණු කරයි.
* එක් එක් කර්මාන්ත පවත්වා ගෙන යාමේ දී ඇති වන ගැටළු අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.
* එක් එක් කර්මාන්ත ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වයි.
* තෝරාගත් කර්මාන්තවල වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීමක් කරයි.
* ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කර්මාන්තවල වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු ඉදිරිපත් කරයි.

**පාඩම ඃ-** ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා - මෝටර් රථ එකලස් කිරීම හා බෝට්ටු නිෂ්පාදනය

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 126 සිට 128 තෙක් හොඳින් කියවන්න. පහත දක්වා ඇති සටහන්ද උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරකද පරිශීලනය කර වැඩිදුර අධ්‍යයනය කරන්න.

- ශ්‍රී ලංකාව තුළ මෑත කාලීනව ආරම්භ වූ කර්මාන්ත අතර වර්ධනීය ලක්ෂණ පෙන්නුම් කරන කර්මාන්තයක් ලෙස මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය හැඳින්විය හැකිය.
- 2001 වර්ෂයේ පොල්ගහවෙල ප්‍රදේශයේ ආරම්භ වූ මයික්‍රෝ මෝටර් රථ කර්මාන්තයද ආනයනික මෝටර් රථ කොටස් එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ආරම්භ වූවකි.
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ශක්තිමත් වීම, විවිධ මාදිලියේ මෝටර් රථ එකලස් කිරීම, මෝටර් රථ සඳහා නව තාක්ෂණික ශිල්ප ක්‍රම හා විවිධ උපාංග යොදා ගැනීම මෙම කර්මාන්තයෙහි දක්නට ඇති ප්‍රවණතා වේ.
- මෙරට කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ බෝට්ටු සඳහා දේශීය ඉල්ලුම වැඩි වීමත්, සංචාරක අංශයේ සිදු වූ වර්ධනයත් නිසා බෝට්ටු නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස දියුණු විය.

- දැව බෝට්ටු නිෂ්පාදනය පිළිබඳ පාරම්පරික අත්දැකීම් නිසා උසස් වර්ගයේ බෝට්ටු නිෂ්පාදනයට ශ්‍රී ලංකාව සමත් වී තිබේ.
- මෙරට පෞද්ගලික ව්‍යවසායකයින් රැසක් දේශීය මෙන්ම විදේශීය වෙළඳපළ සඳහාද බෝට්ටු නිෂ්පාදනය කරනු ලැබේ.
- ඉන්දියාව, මාලදිවයින, සිංගප්පූරුව, නෝර්වේ, දකුණු කොරියාව, සී සෙල්ස් දූපත් සඳහා මෙරට බෝට්ටු අපනයනය කරන අතර ශ්‍රී ලංකාවේ බෝට්ටුවලට ඇති ඉල්ලුම ක්‍රමිකව ඉහළ ගොස් ඇත.

**ක්‍රියාකාරකම**

01. දේශීය වශයෙන් මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය ආරම්භ වීමට හේතු  දෙකක් ලියන්න.
02. ශ්‍රී ලංකාවේ මෝටර් රථ එකලස් කිරීමේ කර්මන්තායතනය හඳුන්වන නම කුමක්ද?
    එය පිහිටි ප්‍රදේශය හා පිහිට වූ වර්ෂය ලියන්න.
03. මෝටර් රථ කර්මාන්තය තුළ දක්නට ඇති ගැටලු හා ප්‍රවණතා තුන බැගින් ලියන්න.
04. මෙරට කුඩා හා මධ්‍ය පරිමාණයේ බෝට්ටු නිෂ්පාදනයට යොමු වීමට හේතු මොනවාද?
05. ශ්‍රී ලංකාවෙන් බෝට්ටු අපනයනය කරන රටවල් හයක් ලියන්න.
06. මෙරට නිෂ්පාදනය කරන බෝට්ටු වර්ග පහක් නම් කරන්න.
07. ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය තුළ දක්නට ඇති ගැටලු හා ප්‍රවණතා ලියන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ඃ-**


- Geological Survey and Mines Bureau, Sri Lanka Minerals Year Book – (2012)
- The National Atlas of  Sri Lanka (2007)
- කාර්ය සමාලෝචනය (2012), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.
- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (2012), ශ්‍රී ලංකා මහ බැංකුව.
- හේරත් ජේ. ඩබ්. (1979), ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්, භූ විද්‍යා  සමීක්ෂණ දෙපාර්තමේන්තුව.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියෙනේ පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/